**කොලොන්න ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**-------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**---------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූනි 29 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කොලොන්න ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ------------- | ---------------------------- |
| (අ) | සභා ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම හා ගබඩාව සකස් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල වැයකර තිබූ රු. 3,518,880 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | අදාල වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | ඉකුත් වර්ෂයට අදාල බලපත්‍ර ගාස්තු රු.198,300 ක් සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉකුත් වර්ෂයට අදාල ආදායම් සමුච්චිත අරමුදලට ගැලපීම් කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | අයකර ගත නොහැකි බවට තීරණය කරන ලද සමාලෝචිත වර්ෂයට අදාල ජල ගාස්තු රු. 88,400 ක් සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | වර්ෂයට අදාල ආදායම් වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | වර්ෂය අවසාන දිනට මුදල් පොතේ ශේෂය රු. 7,709,270 ක් වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල එය රු. 7,897,204 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 187,934 ක වෙනසක් පැවතුණි. | ශේෂ සසඳා නිවැරදි ශේෂය ගිණුම්වල දැක්විය යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මූල්‍ය ප්‍රකාශන අනුව මෝටර් රථ හා කරත්ත ගිණුමේ ශේෂය රු. 24,341,834 ක් වුවද, එදිනට මෝටර් රථ හා කරත්ත උපලේඛණය අනුව ශේෂය රු.29,047,137 ක් වූයෙන් රු.4,705,303 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දැක්වෙන වත්කම් ඊට අදාල උපලේඛන සමඟ සැසඳිය යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඊ) | 2017 වර්ෂයේ සිට රු. 944,970 ක් වූ ගබඩා ණයහිමි ශේෂයක් මූල්‍ය ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණද, ඒ සම්බන්ධ විස්තරාත්මක තොරතුරු සභාව සතුව නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 02 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | වාහන අළුත්වැඩියා කටයුතු යාවත්කාලීනව සිදුකර ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකළ යුතුවේ. | අදාල වාහනවල අළුත්වැඩියා කටයුතු අවසන් කළ පසු ඉන්ධන දහන පරීක්ෂාව සිදු කරමි. |
| (ii) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂිකව අත්සන් කලයුතු කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම වර්ෂයේදී කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ආයතනික කාර්යයභාරයේ නිමවුමට අදාල නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යයසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල දර්ශක හඳුනාගත යුතුවේ. | පෙන්වා දී ඇති චක්‍රලේඛ අධ්‍යයනය කර ඒ අනුව අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 ජූලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභියාට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමේ අවස්ථාව සලසාදීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට සභාව අපොහොසත්ව තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරමින් සේවාලාභීන් වෙත අදාල පහසුකම් ලබාදීමට කටයුතු කළ යුතුවේ. | පෙන්වා දී ඇති චක්‍රලේඛ අධ්‍යයනය කර ඒ අනුව අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,057,885 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,140,777 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,146,200 | 1,087,543 | 971,681 | 253,228 | 952,000 | 983,154 | 1,027,574 | 214,672 |
| කුලී | 6,016,600 | 4,216,735 | 4,215,682 | 187,159 | 4,404,814 | 4,435,691 | 4,255,369 | - |
| බලපත්‍ර ගාස්තු | 1,129,475 | 1,407,846 | 1,407,846 | - | 1,032,900 | 1,076,893 | 1,076,893 | - |
| වෙනත් ආදායම් | 10,510,525 | 8,869,161 | 8,908,142 | 7,352,071 | 8,753,225 | 9,643,820 | 10,713,656 | 8,905,259 |
| | 18,802,800 | 15,581,285 | 15,503,351 | 7,792,458 | 15,142,939 | 16,139,558 | 17,073,492 | 9,119,931 |

#### 2.2.2 වෙනත් ආදායම්

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හිඟ ජල ගාස්තු ශේෂය රු. 251,793 ක් වූ අතර, ඉන් රු. 16,698 ක් වසර 03 කට වඩා පැරණි හිඟ ගාස්තු විය. | හිඟ ජල ගාස්තු නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වසර 03 කට වැඩි හිඟ ජල ගාස්තු වලට අදාල ජල සම්බන්ධතා විසන්ධි කර ඇති බවත්, පවතින ගැටළු නිරාකරණය කර ගනිමින් හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ උසාවි දඩ රු. 2,634,072 ක් වූ අතර, 2015 අප්‍රේල් සිට 2019 ජූනි දක්වා කාලපරිච්ඡේදයට අදාලව අයවිය යුතු මුද්දර ගාස්තු රු. 484,700 ක් විය. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගත යුතුවේ. | උසාවි දඩ මුදල් මේ වනවිට ලැබී ඇති බවත්, මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වාර්ෂික අයවැය ලේඛනය මගින් බල ප්‍රදේශයේ මාර්ග වැඩිදියුණු කිරීම සඳහා පළාත් සභා, විමධ්‍යගත හා සභා අරමුදල් වලින් රුපියල් මිලියන 13.35 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති කිසිවක් ක්‍රියාකාරී සැලැස්ම මගින් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. | වාර්ෂික අයවැය මගින් සංවර්ධන කටයුතු සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන වලින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළ යුතුවේ. | බොහොමයක් සංවර්ධන කටයුතු පළාත් සභාවෙන් හා මධ්‍යම රජයේ ප්‍රතිපාදන අනුව ඉටු කර ගැනීමට අපේක්ෂා කරන බැවින් ඒවා කල්තියා නිශ්චිතව හඳුනාගැනීමට අපහසු බව දන්වමි. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සභාව අපොහොසත් වී තිබුණි. | ප්‍රතිපාදන සලසා ගෙන යෝජිත කසළ කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලද පසු කොම්පෝස්ට් ව්‍යාපෘතිය ආරම්භ කරන බවත් මේ වනවිට දිරන හා නොදිරන කසළ වෙන්ව එකතු කර නොදිරන කසළ අලෙවි කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ලේකම් තනතුර, කාර්මික නිලධාරී තනතුර හා ආදායම් පරීක්ෂක තනතුර පුරප්පාඩුව පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාවේ පවතින තනතුරු පුරප්පාඩු සම්බන්ධව අවස්ථා කිහිපයකදීම පළාත් සභාව වෙත ඉදිරිපත් කර ඇති බව දන්වමි. |

**3.3 වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රීය වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව නව ගොඩනැගිල්ල වෙත ගෙන යාමෙන් පසු පැරණි සභා ගොඩනැගිල්ල ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යොදා ගෙන නොතිබුණි. | අදාල ගොඩනැගිල්ල ඵලදායී කාර්යයන් සඳහා යොදා ගත යුතුවේ. | පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිරියේදී ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමට අපේක්ෂිත බව දන්වමි. |
| (ආ) | සභාව සතු කැබ් රථයක් හා ට්‍රැක්ටර් 03 ක් අළුත්වැඩියා කලයුතු වීම හේතුවෙන් වසර 03 ත් 04 ත් අතර කාලයක් ධාවනයේ යොදවා නොතිබූ අතර, රියදුරෙකු නොමැති වීම හේතුවෙන් සභාව සතු ජල බවුසරය 2016 දෙසැම්බර් 30 සිට නිෂ්කාර්යයව පැවතුණි. | වත්කම් යාවත්කාලීනව නඩත්තු කළ යුතු අතර, රියදුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කැබ් රථය අළුත්වැඩියාව සඳහා සභාවේ මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා පළාත් සභාව වෙතින් ප්‍රතිපාදන ලබා ගැනීමට ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇති බවත්, රියදුරු පුරප්පාඩු හේතුවෙන් වාහන ඵලදායී ලෙස උපයෝජනය කිරීමට නොහැකි වී ඇති බවත් දන්වමි. |

**3.4 ප්‍රසම්පාදනය**

**කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නන්දනගම ඉළුක්පැලගොඩ මාර්ගය පස් කපා සංවර්ධනය කිරීමේ කර්මාන්තය 2019 ජුලි 02 දින අවසන්ව රු. 300,000 ක් ගෙවා තිබුණද, 2019 නොවැම්බර් 22 දින | සභා අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | පසුගිය කාලයේ අධික වැසි තත්ත්වය සමඟ වල් බිහි වී තිබූ එම මාර්ගය ප්‍රදේශවාසීන්ද සහභාගී කර ගනිමින් වාහනයක් ගමන් |

| | | |
|---|---|---|
| වනවිට එම මාර්ගය සේදී ගොස් වලවල් හැරී වාහනයක් ගමන් කිරීමට නොහැකි තත්ත්වයට පත්වී තිබීම හේතුවෙන් වැය කරන ලද මුදල නිශ්ඵල වී තිබුණි. | | කළ හැකි තත්ත්වයට නැවත පත් කළ බව දන්වමි. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**------------------------------------------**

**නොවිසඳී ඇති නිරීක්ෂණ**

**------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1998 වර්ෂයේදී සහා අරමුදලින් අත්තිකාරම් ලෙස ගෙවා තිබූ සභික දීමනා රු. 33,000 ක් පියවා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | අදාල අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පළාත් සභාවෙන් ලද උපදෙස් අනුව මහ සභාව වෙත යොමුකර එම අත්තිකාරම කපා හැරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |